# කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## පොල් වගාකිරීමේ මණ්ඩලය

## තනතුරු පුරප්පාඩු /2024

**පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් (ආ.පො.උ.) සේවාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා**

## ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර: කළමනාකරණ සහකාර / විගණන සහකාර (ආ.පො.උ.) (MA 1-1) -III ශ්‍රේණිය**

**සේවා ස්ථානය :-** ප්‍රධාන කාර්යාලය, තනතුරු 03යි.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ,

I. සිංහල / දෙමළ භාෂාව
II. ගණිතය

යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) සමත්ව තිබීම

සහ

ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී එකවර විෂයන් 03ක් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් 04ක් සමත්ව තිබීම.

ඇ) පිළිගත් ආයතනයක පරිගණක / ලේකම්කරණ / ගබඩාකරණ / වතු ගිණුම්කරණ හෝ තනතුරට අදාළ පාඨමාලාවක් හදාරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**වැටුප් කාණ්ඩය** :MA1-1

**වැටුප් පරිමාණය** :රු. 27,910 - 300x10 - 350x07 - 495x04 – 660x20 – 48,540

**වයස** : 18ට නොඅඩු හා අවු: 30ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ/ සංස්ථා/මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ

**තනතුර: සංචාරක බංගලා සහායක (ආ.පො.උ.) PL2**

**සේවා ස්ථානය** :- සේවා අවශ්‍යතාවය අනුව දිවයිනපුරා පිහිටි සංචාරක බංගලා වල, තනතුරු 04යි.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් වත්සමත් වී තිබිය යුතුය.

සහ

රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් පෙර / අපරදිග කෑම වර්ග පිළියෙල කිරීම / සංචාරක බංගලා සහායකු ලෙස ලබාගත්ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) දෙවන මට්ටමට නොඅඩුසහතිකය සමඟ පිළිගත්ආයතනයකඅරක්කැමියෙකු හෝ සංචාරක බංගලා සහායකු වශයෙන් ලබා ඇති වසර 02ක පළපුරුද්ද

**වැටුප් කාණ්ඩය** :PL 2

**වැටුප් පරිමාණය** :රු. 25,750-270x10 - 300x10 - 330x10 - 350x12 - 38,950

**වයස** : වයස අවු 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ නියුතුඅයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

**තනතුර: සංචාරක බංගලා කම්කරු )වතු((ආ.පො.උ.) PL1**

**සේවා ස්ථානය :-** සේවා අවශ්‍යතාවය අනුව දිවයිනපුරා පිහිටි සංචාරක බංගලා වල, තනතුරු 05යි.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන්දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් දෙකක් සහිතවසමත්වීතිබියයුතුය.

**වැටුප් කාණ්ඩය** :PL 1

**වැටුප් පරිමාණය** :රු. 24,750- 250x10-270x10- 300x7-330x15-37,000

**වයස** : වයස අවු 22 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ නියුතුඅයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

**වෙනත් කොන්දේසි** :

I. සෑම ඉල්ලුම්කරුවෙක් ම, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත් :**

- **ඒ අනුව 2024.03.15 දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත වෙබ් අඩවියේ ඇති ආදර්ශ ආකෘතියට අනුව හෝ තමන් විසින් සකස් කර ගත් ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකළ යුතුවේ.**

  එමෙන්මඅධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවලසහතික කළ පිටපත් සමඟ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේනම් එක තනතුරකට එක බැගින් වන සේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතු වේ.
- සියලුම අයදුම්පත් 2024.03.15 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය.ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සළකා කටයුතු කරනු ලැබේ.

**සභාපති,**
**පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල්**
**කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

**ඉහත තනතුරු සඳහා අදාළ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලෙස දන්වමි. එමෙන්ම එසේ බාගත කරගැනීමේ යම් අපහසුතාවයක් ඇති වුවහොත් තමන් විසින් සකස් කර ගත් ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකරන ලෙස දන්වමි.**
**https://coconutsrilanka.lk/**